www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 196 8: ප්‍රන්ස මහා වැඩවර්ජනය සහ ශිෂ්‍ය කැරැල්ල

## 1968: The general strike and the student revolt in France

**හයවන කොටස: ඕසීඅයිහි මාධ්‍යමික පිලිවෙත (2)**

**Part 6: The centrist line of the OCI (2)**

**පීටර් ෂ්වාට්ස් විසිනි**

**2008 සැප්තැම්බර් 5**

*මෙහි පලවන්නේ 1968 ප්‍රන්ස මැයි/ජුනි සිද්ධීන් අරබයා පලවන ලිපි මාලාවක හයවැන්න යි. මැයි 28 දා පලකල පලමු කොටස මැයි මස අවසානයේ කූටයට ලඟා වූ ශිෂ්‍ය කැරැල්ලේ වර්ධනය පිරික්සා බලයි. මැයි 29 දා පලකල දෙවන කොටස තත්ත්වය පාලනය කරගැනීමට ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂය (ප්‍රකොප) සහ එමගින් පාලිත සීජීටී වෘත්තීය සමිතිය ජනාධිපති චාල්ස් ඩි ගෝල්ට උපකාරී වූ ආකාරය විභාග කරයි. පිලිවෙලින් ජුලි 5 සහ 7 වන දිනවල පලකෙරුනු තුන්වන සහ හතරවන කොටස් පැබ්ලෝවාදීන්ගේ භූමිකාව විභාග කරයි. පස්වන, හයවන, හත්වන සහ අටවන කොටස් පියරේ ලොම්බෙයාගේ ජාත්‍යන්තර කොමියුනිස්ට් සංවිධානයේ භූමිකාව පරීක්ෂා කරයි. පස්වන කොටස සැප්තැම්බර් 4 වන දා පලකරනු ලැබීය.*

### මධ්‍යම ස්ට්‍රයික් කමිටුවක් පිලිබඳ සටන් පාඨය

1935 දී ලියොන් ට්‍රොට්ස්කි සිය ප්‍රන්ස ආධාරකරුවන්ට "ක්‍රියාකාරී කමිටු" පිලිබඳ සටන් පාඨය යෝජනා කලේ ය. ඒ සමයේ කම්කරු පන්තියේ වේගවත් රැඩිකලීකරනයක් වර්ධනය වුවත් එය පැවතුනේ ස්ටැලින්වාදීන්, සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් සහ ධනේශ්වර රැඩිකලුන්ගේ ප්‍රති-විප්ලවීය සන්ධානයක් වූ මහජන පෙරමුනේ අනසක යටතේ ය. මෙම තතු යටතේ ක්‍රියාකාරී කමිටු වනාහි මහජනයා මත මහජන පෙරමුනේ බලපෑම දුර්වල කරන සහ ඔවුන්ගේ ස්වාධීන ආරම්භකත්වය දිරිමත් කරන උපකරනයක් ලෙස ට්‍රොට්ස්කි දැක ගත්තේ ය.

*"මහජන පෙරමුනේ නායකත්වය යනු අරගලයේ යෙදී සිටින ජනයාගේ කැමැත්තේ ඍජු හා ක්ෂනික පිලිබිඹුව විය යුතු ය. කෙසේ ද? ඉතා ම සරල ලෙසිනි: මැතිවරන හරහා ය," යි ඔහු ලිවී ය. දෙන ලද නගරයක, දිස්ත්‍රික්කයක, කම්හලක, බැරැක්කයක හෝ ගමක එයට ආසක්ත වී සිටින ජනයා දෙසීයක්, පන්සීයක් හෝ දහසක් තම සටන්කාමී ක්‍රියාකාරීත්වයේ කාලයේ ප්‍රාදේශීය ක්‍රියාකාරී කමිටුවට ඔවුන්ගේ නියෝජිතයෝ තෝරා පත් කරති. අරගලයේ සියලු සහභාගිකරුවෝ එම කමිටුවේ විනයට බැඳී සිටිති."* [14]

1968 ඕසීඅයි සංවිධානයේ මැදිහත් වීමේ හරිමැද තිබූ "මධ්‍යම ස්ට්‍රයික් කමිටුව" පිලිබඳ සටන් පාඨය ව්‍යුත්පන්න කරගනු ලැබුවේ ට්‍රොට්ස්කිගේ යෝජනාවෙනි. ඕසීඅයිහි ප්‍රකාශන ට්‍රොට්ස්කිගේ රචනාවලින් වචනයෙන් වචනය පාහේ උපුටාගත් සූත්‍රගත කිරීම් ගනනාවක් ම අඩංගු කරගනී. එහෙත් එක්සත් පෙරමුනු උපාය පිලිබඳ අවස්ථාවේ දී මෙන් ම මෙම සටන් පාඨය ද එහි කිසිදු විප්ලවවාදී අන්තර්ගතයකින් තොරව ඕසීඅයි සොරා ගත්තේ ය.

එහි බොහෝ ප්‍රකාශන ජාතික ස්ට්‍රයික් කමිටුව පදනම් විය යුතු ධුරාවලීමය ව්‍යුහයේ විවිධ මට්ටම් නිලධාරීවාදීමය තථ්‍ය ගනන් තැබීමට සීමා විය. මේ සඳහා මනා උදාහරනයක් වන්නේ "ඔව්, කම්කරුවන්ට ජයගත හැකි යෑ අපි ජයග්‍රහනයේ ආයුධය වන මධ්‍යම ස්ට්‍රයික් කමිටුව පෙරට ගනිමු!" යන උද්ධෘතගත ප්‍රකාශනය යි. මැයි 23 දා ප්‍රසිද්ධ කල එය ඉන්ෆෝමේෂන් ඕරියරේහි විශේෂ කලාපයක් ලෙස මහා වැඩවර්ජනය මධ්‍යයේ පුලුල්ව බෙදා හරිනු ලැබී ය.

ප්‍රකාශනයේ පහත සඳහන් ඡේදය අන්තර්ගත කර ගනියි: *"කම්කරුවන්ගේ හා තරුනයන්ගේ පොදු ව්‍යාපාරය තනි, පරාජය කල නො හැකි හා විජයග්‍රාහී බලයක් බවට පත් කරනු ලැබිය හැක්කේ කෙසේ ද? මෙමෙ ප්‍රශ්නයට ඇත්තේ එකම එක පිලි තුරක් පමනි. එනම්, ප්‍රාදේශීය ස්ට්‍රයික් කමිටු අන්තර්-වෘත්තීය ස්ට්‍රයික් කමිටු බවට සංවිධානය කිරීම යි. දෙපාර්තමේන්තු මට්ටමේ දී නියෝජිතයෝ දෙපාර්තමේන්තුමය සහ ප්‍රාදේශීය අන්තර්-වෘත්තීය ස්ට්‍රයික් කමිටු නිර්මානය කල යුත්තා හ. ජතික මට්මේ දී ස්ට්‍රයික් කමිටුවල මහා සම්මේලනය සහ කම්කරු සංවිධාන මධ්‍යම ස්ට්‍රයික් කමිටුවක් ස්ථාපනය කල යුතු ය.*

"ස්ට්‍රයික් කමිටුව තුල සිටින සෑම ක්‍රියාකාරිකයෙක්මත් පිකට් වැටවලට අයත්වන සෑම කම්කරුවෙක්මත් එවැනි ආකාරයේ ආරම්භකත්වයක් ගත යුතු ය. පන්ති ව්‍යාපාරයේ මහා ජනතාවන්ගේ නායකත්වය සහ තීරන සමාගම් ස්ට්‍රයික් කමිටුවලින් ඉස්මතුව ඇති අන්තර්-වෘත්තීය ස්ට්‍රයික් කමිටු තුලට ඇදගනු ලැබිය යුතු ය. එක් නිශ්චිත ස්ථානයක රැස්වන සමාගම් තුල වර්ජකයන්ගේ රැස්වීම් සහ සියලු සමාගම්වල සියලු වර්ජකයන්ගේ රැස්වීම් සාමූහික තීරන ගැනීමේ බලය සංස්ථාපනය කල යුතු ය."

මෙම ප්‍රකාශනයේ භාෂාවට පමනක් නොව අන්තර්ගතයට ද විප්ලවවාදී කම්කරුවකුගේ සටන්කාමී ජීව ගුනයට වඩා ගනකාධිකාරීවරයෙකුගේ නිලධාරිවාදී මනෝගතිය සමග පොදු වූ බොහෝ දෑ ඇත. එහි ඉලක්කය වන්නේ එකිනෙකාට සතුරු නිලධාරිවාදී උපකරනයන් අතර බෙදීම් සමහන් කිරීම මිස සියලු නිලධාරිවාදී උපකරනයන්ගේ ගලග්‍රහයෙන් කම්කරුවන් විමුක්ත කරගැනීම නො වේ. ක්‍රියාකාරී කමිටුව වනාහි "පක්ෂයේ සහ වෘත්තීය සමිති උපකරනවල විප්ලව-විරෝධී විරුද්ධත්වය බිඳීමේ එක ම ක්‍රමය" ය යනුවෙන් ට්‍රොට්ස්කි ලියූ අතර ඕසීඅයිට අනුව මධ්‍යම ස්ට්‍රයික් කමිටුව වනාහි "වෘත්තීය සමිති සහ කම්කරුවන්ගේ පක්ෂවල එක්සත් පෙරමුනේ ඉහල ම ප්‍රකාශනය යි."

ට්‍රොට්ස්කි ක්‍රියාකාරී කමිටු සැලකුවේ විවාදයේ සහ දේශපාලනික අරගලයේ මන්ඩප ලෙස යඃ *"පක්ෂය සම්බන්ධයෙන් ගත්කල ක්‍රියාකාරී කමිටු විප්ලවවාදී පාර්ලිමේන්තුව ලෙස සඳහන් කල හැකි යඃ පක්ෂ එයින් ඉවත් කරනු ලබන්නේ නැති අතර ඒ වෙනුවට ඒවා පූර්ව යෝජිත ය; ඒ අතරවාරයේ ම ඒවා ක්‍රියාකාරීත්වයේ දී පරීක්ෂාවට ලක් වන අතර මහජනයා කුනු වූ පක්ෂවල ග්‍රහනයෙන් නිදහස් වීමට තමන් ම උගෙනගනිති."*

ඕසීඅයි සඳහා නම් මධ්‍යම ස්ට්‍රයික් කමිටුව කම්කරුවන් කුනු වූ වෘත්තීය සමිති හා පක්ෂ සමග "එකමුතුව" ස්ථාපනය කිරීමට සේවය කරයි.

ස්ට්‍රයික් කමිටු පිලිබඳ සටන් පාඨය සංක්‍රමන ඉල්ලීම්වල ක්‍රියාමාර්ගයක් සමග සම්බන්ධ කිරීමෙන් පවා ඕසීඅයි වැලකුනේ ය. ඩි මැසෝගේ ග්‍රන්ථයේ පහත දැක්වෙන ඡේදය පැහැදිලි කරන පරිදි ස්ට්‍රයික් කමිටුව යනු ඕසීඅයි සඳහා ක්‍රියාමාර්ගය වීය. "යමෙක් දැකගත හැකි පරිදි මධ්‍යම ස්ට්‍රයික් කමිටුව පිලිබඳ ගැටලුව සමගින් මහා වැඩවර්ජනයේ ම ඉරනම බැඳී තිබුනි. *මෙම ඉලක්කය සංවිධානාත්මකව, එනම් ඉහල ම දේශපාලන මට්ටමින්, ව්‍යාපාරයේ අවශ්‍යතාවලට අනුරූපී සියලු සංරචකයන් - එනම් මහා වැඩවර්ජනයේ මූලික ඉලක්ක සහ එහි දේශපාලනික විපාක පිලිබඳ සංරචකය, වැඩවර්ජනය ඒකාබද්ධ කිරීමේ සංරචක, එක්සත් කම්කරු පෙරමුනක් යථාවත් කරගැනීමේ සංරචක...- ඒකාබද්ධ කරයි.* [15]

මෙම "සංවිධානාත්මකව - එනම් ඉහල ම දේශාපලනික මට්ටමේ දී- යන්න ඕසීඅයි සංවිධානයේ මාධ්‍යමික දෘෂ්ටිය පැහැදිලිව ප්‍රකාශ කරයි. මාක්ස්වාදීන්ට නම් ඉහල ම දේශපාලන ගැටලු වන්නේ ඉදිරි දර්ශනය පිලිබඳ ගැටලු ය. *මාධ්‍යමිකයන් සඳහා ඒවා සංවිධානාත්මක ඒවා වේ.* එහෙත් 1968 මහා වැඩවර්ජනය මෙන් ම ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ අනෙකුත් ගනන් නැති අත්දැකීම් පෙන්වා දී ඇති පරිදි සංවිධානාත්මක එක්සත් බව සඳහා වන ආයාචනයට සමාජය සමාජවාදීව පරිවර්තනය කිරීම හා සම්බන්ධ සංකීර්න ගැටලුවලට පිලිතුරු දිය නො හැකි ය. ඒ *සඳහා දේශපාලන ඉදිරි දර්ශනයක් ද ධනේශ්වරයෙන් සහ එහි ප්‍රතිසංස්කරනවාදී හා මාධ්‍යමිකවාදී ඒජන්තයන්ගෙන් පැහැදිලි බිඳී වෙනවීමක් ද අවශ්‍ය කෙරේ.*

ඕසීඅයි සංකල්ප, ට්‍රොට්ස්කි තමන් ක්‍රියාකාරී කමිටු පිලිබඳව ලියූ ලිපියේ දී නො සඟවා පහර දුන් කුප්‍රකට මාධ්‍යමිකයෙකු වූ මාකෝ පිවෙට්ගේ සංකල්පවල පැහැදිලි අතීතාවර්ජනයන් වේ. "මාධ්‍යමිකයෝ 'ජනතාවන්' පිලිබඳව කොතෙක් දෙඩවූවත් කම් නැත, ඔවුන් නිරන්තරයෙන් දිශාගත වන්නේ ප්‍රතිසංස්කරනවාදී උපකරනය මත යි. ඒ හෝ මේ විප්ලවීය සටන් පාඨය පුනරුච්චාරනය කරන මාකෝ පිවෙට්, ක්‍රියාකාරීත්වයේ දී විප්ලවවාදීන්ට එරෙහිව දේශප්‍රේමීන් සමග එකමුතුව බවට පත්වන 'සංවිධානාතක්මක එකමුතුව' යන වියුක්ත මූලධර්මයට එය යටපත් කරයි. එක්සත් සමාජ-දේශප්‍රේමී උපකරනයන්ගේ විරුද්ධත්වය පරාජය කිරීම ජනතාවන් සඳහා ජීවිතයත් මරනයත් අතර ප්‍රශ්නයක් වන විට වාම මාධ්‍යමිකයෝ මෙම උපකරනවල 'එකමුතුව' විප්ලවවාදී අරගලයේ අවශ්‍යතාවලට ඉහලින් පිහිටන පරම 'සාධු ගුනයක්' ලෙස සලකති."

ට්‍රොට්ස්කි තම විශ්ලේෂනය සමාප්ත කලේ යලි වතාවක් ක්‍රියාකාරී කමිටු පිලිබඳ තම සංකල්පය පැහැදිලි කරමිනි. "ක්‍රියාකාරී කමිටු ගොඩනගනු ලබනු ඇත්තේ *ද්‍රෝහී සමාජ-දේශප්‍රේමී නායකත්වයෙන් ජනයා මුදාගැනීමේ* අවශ්‍යතාව අවසානය දක්වා ම තේරුම් ගන්නා අය විසින් පමනි. නිර්ධනීන්ගේ ජයග්‍රහනය සඳහා කොන්දේසිය වන්නේ *වත්මන් නායකත්වය දියකර හැරීම යි.* මෙම කොන්දේසි යටතේ 'එකමුතුව' සඳහා වන සටන් පාඨය හුදෙක් මුග්ධත්වයක් පමනක් නොව අපරාධයක් බවට ද පත්වෙයි. *ප්‍රන්ස අධිරාජ්‍යවාදයේ සහ ජාතීන්ගේ සංගමයේ නියෝජිතයින් සමග එකමුතුවක් එපා!* ඔවුන්ගේ ද්‍රෝහී නායකත්වයට එරෙහිව විප්ලවීය ක්‍රියාකාරී කමිටු පිහිටුවීම අවශ්‍ය ය. මෙම ක්‍රියාකාරී කමිටු ගොඩනැගිය හැක්කේ මාකෝ

පිවෙට් විසින් නීත ඊනියා 'විප්ලවවාදී වාමාංශයේ' ප්‍රති-විප්ලවවාදී පිලිවෙත් අනුකම්පා විරහිතව හෙලිදරවු කිරීමෙන් පමනි." (අවධාරනය මුල් කෘතියේ)

## මහා වැඩ වර්ජනය සමයේ ඕසීඅයි

1968 දී ඕසීඅයි සතුව තිබුනු සම්පත් සාපේක්ෂව සීමා සහිත වුවත් ඒවා තවමත් පැබ්ලෝවාදීන්ගේ සම්පත්වලට වඩා බලගතු විය. *ඕසීඅයිය ට විප්ලවවාදී ශිෂ්‍ය සම්මේලනය (එෆ්ඊආර්) නම් තමන්ගේ ම ශිෂ්‍ය සංවිධානයක් තිබුනු අතර පැබ්ලෝවාදීන්ට මෙන් නොව ඔවුන්ට කම්හල් ගනනාවක ම සහයෝගය තිබුනි.*

එෆ්ඊආර් සංවිධානය "විප්ලවවාදී පෙරටු බලඇනියේ" භූමිකාව ශිෂ්‍යයන්ට ආරෝපනය කල සහ ශිෂ්‍ය අතිවික්‍රමයන්ට අවිවේචනාත්මකව සහයෝගය පලකල පැබ්ලෝවාදීන්ගේ හා නව වමේ සංකල්ප ප්‍රතික්ෂේප කලේ ය. *කම්කරු පන්තිය වෙත දිශාගතවීමක් සඳහා සටන් කල එෆ්ඊආර් සංවිධානය එම පදනම මත සැලකිය යුතු නව සාමාජිකත්වයක් දිනා ගත්තේ ය.*

එහෙත් මෙම දිශානතිය සංවිධානාත්මක ආරම්භකත්වයන්ට සීමා වෙමින් මාධ්‍යමික අත්තිවාරමක පදනමේ පැවතුනි. *එය ක්‍රියාකාරී වූයේ ඕසීඅයිහි "එක්සත් පෙරමුනු" රාමුවේ එනම් කම්කරුවන්ගේ සහ තරුනයන්ගේ මහා පරිමාන එක්සත් විරෝධතා පැවැත්වීමට වෘත්තීය සමිති වෙත ආයාචනා කිරීම සමගින් මධ්‍යම ස්ට්‍රයික් කමිටුවක් සඳහා ආයාචනා කිරීම වෙත බැඳීගෙන ය.* ධනේශ්වර දෘෂ්ටිවාදය සඳහා ජනක ස්ථානය වන විශ්ව විද්‍යාලවල දී තීරනාත්මක විය හැකිව තිබුනු ස්ටැලින්වාදීන්ගේ සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ පිලිවෙත්වලට ද නව වාමාංශයේ න්‍යායන්වලට ද එරෙහිව ක්‍රමානුකූල ප්‍රතිප්‍රහාරයක් එෆ්ඊආර් විසින් දියත් කරනු නො ලැබී ය.

ලතින් චතුරස්‍රයේ වීදි සටන් පැවතෙද්දී පැරිස්හි මියුතුලිතේ නම් ස්ථානයේ පැබ්ලෝවාදී විප්ලවවාදී කොමියුනිස්ට් තරුනයෝ (ජේසීආර්) විසින් මැයි 8 දා පවත්වන ලද රැස්වීමකට එෆ්ඊආර් විසින් කරන ලද මැදිහත්වීම පිලිබඳව ඩි මැසෝ තම කෘතිය තුල විස්තර කරයි. ජේසීආර් කථිකයෙකුට අරාජකවාදී ඩැනියෙල් කෝන්-බෙන්ඩිට් විසින් අත්පුඩි ගසන ලද අතර එම කථිකයා දේශපාලන පිලිවෙතේ පැහැදිලිකමට එරෙහිව කථාකලේ එලෙස කතාකලහොත් ව්‍යාපාරය බිඳී යාවි යයි කියාපාමිනි. ඒ වෙනුවට ඔහු අවධාරනය කලේ කාරනයනම් සියල්ලන්ට එකග විය හැකි මාතෘකා සොයාගැනීම පිලිබඳ කාරනයක් බව ය. *"විප්ලවවාදී පක්ෂයක් නොමැති තතු තුල සැබෑ විප්ලවවාදීන් වන්නේ පොලීසිය සමග සටන් කරන අය ය," යයි ජේසීආර් කථිකයා ප්‍රකාශ කලේ ය.*

මෙම ආස්ථානයට එෆ්ඊආර් නියෝජිතයින් විසින් විරුද්ධත්වය දක්වන ලද අතර ඔවුන් යෝජනා කලේ ශිෂ්‍යයන්ගේ සකල ආධ්‍යාසය ම "කම්කරුවන්ගේ හා තරුනයන්ගේ මධ්‍යම විරෝධතා දැක්වීම්" පිලිබඳ සටන් පාඨය ක්‍රියාවට දැමීම මත කේන්ද්‍රගත කල යුතු බවයි. "යූඑන්ඊඑෆ් මධ්‍යම ශිෂ්‍ය සංවිධානයේ සහයෝගය සහිතව ස්ට්‍රයික් කමිටු සහ ජාතික ස්ට්‍රයික් කමිටුවක් ගොඩනැගීම හරහා අරගලය තවදුර ප්‍රසාරනය, සම්බන්ධීකරනය සහ සංවිධානය කල යුතු" යයි එෆ්ඊආර් තර්ක කලේ ය. දෙදිනකට පසුව "කම්කරුවන් 500,000ක් ලතින් චතුරස්‍රයට" යන සටන් පාඨය යටතේ එෆ්ඊආර් තමන්ගේ ම රැස්වීමක් පැවැත්වී ය. *එම සටන් පාඨය සහිත පත්‍රිකා දස දහස් ගනනක් කම්හල් තුල බෙදා හරින ලදී.* [16]

දින කිහිපයකට පසුව මැයි 13 දා එක්දින මහා වැඩ වර්ජනයක් සහ කම්කරුවන් හා ශිෂ්‍යයන්ගේ ඒකාබද්ධ විරෝධතා කැඳවුම් කිරීමට වෘත්තීය සමිතිවලට බල කෙරුනු ඒවාට මිලියන ගනනක සහභාගිත්වයක් ලැබිනි. ව්‍යාපාරය සමිතිවල පාලනයෙන් ගිලිහී යමින් තිබුනි. *ඊට පසු දින කිහිපයේ මහා වැඩ වර්ජනය කම්හල් අල්ලාගැනීම් රැල්ලක් සමගින් සමස්ත රට පුරා ව්‍යාප්ත වූ අතර ඒවාට කම්කරුවන් දස දහස් ගනනින් සහභාගි වූයේ ප්‍රන්සය පක්ෂාඝාත කරමිනි.*

එහෙත් ඕසීඅයි සහ එෆ්ඊආර් සංවිධාන තම සින්ඩිකල්වාදී පිලිවෙත් නඩත්තු කරගෙන ගියහ. *දැන් ඔවුහු සිය සමස්ත අවධානය ජාතික ස්ට්‍රයික් කමිටුවක් පිලිබඳ ඉල්ලීමට කේන්ද්‍රගත කලහ. මැයි 13 දා ඕසීඅයි සංවිධානය සුවිශේෂීව තමන්ගේ ම නමින් පත්‍රිකාවක් පලකල අතර එය ඊ ලග දින කිහිපයේ දහස් ගනනින් කම්හල් තුල බෙදා හරින ලදී.*

පත්‍රිකාව අඩංගු කරගත්තේ යන්තම් පේලි විස්සක් පමනක් වූ අතර එකදු දේශපාලනික ප්‍රකාශනයක් කිරීමෙන් වැලකුනේය. *("අරගලය ඇරඹී තිබේ," "එකමුතුව දිගුකල් දිනේවා," "ජය නියතයි," " කම්කරුවනි, ශිෂ්‍යයනි සමගි වව්, අපේ ජය නියතයි") යනා දී හිස් හා පිලුනු වූ පාඨ ද ("ඩි ගෝල් හෙලනු," "පොලිස් රාජ්‍යය හෙලනු") වැනි සාමාන්‍ය සටන්පාඨ ද එහි අඩංගු විය.*

තානය එතරම් කඨෝර නොවූවාක් මෙන් ම පෙලෙහි වැඩි ප්‍රමානයක් කැපිටල් සහ තද කලු අකුරුවලින් මුද්‍රනය කරනු ලැබ තිබිනි. පත්‍රිකාව අවසාන *වූයේ "රෙනෝල්ට්, පැන්හාඩ්, එස්එන්ඊසීඑම්ඒ කම්කරුවනි, සියලු කම්හල්, කාර්යාල, වැඩහල්වල*

කම්කරුවනි, ජයග්‍රහනය රැඳී තිබෙන්නේ අප මතයි. අප වැඩකිරීම නවත්වා, විරෝධතාවල යෙදෙමින් ස්ට්‍රයික් කමිටු තෝරා පත්කරගත යුතු ය."

නව තත්ත්වය විශ්ලේෂනය කිරීමට, දේශපාලනික කර්තව්‍යයන් සූත්‍රගත කිරීමට හෝ ඒවා කම්කරුවන්ට විස්තර කිරීමට උත්සාහයක් නො දැරුනි. වේගයෙන් වර්ධනය වන විප්ලවවාදී තත්ත්වයකට මුහුන පෑ කල ඕසීඅයි හට ඉදිරිපත් කිරීමට තිබූ එකම දෙය වූයේ ඒකාබද්ධ ක්‍රියාකාරීත්වයක් සඳහා සාමාන්‍ය ආයාචනයක් කිරීම පමනි. කොමියුනිස්ට් පක්ෂයේ හෝ මිතරොංගේ එෆ්ජීඩීඑස්හි භූමිකාව පිලිබඳ එකදු වචනයක්වත් නැත. වෘත්තීය සමිති නිලධරයේ ද්‍රෝහී භූමිකාව පිලිබඳ අනතුරු හැඟවීමක් නොමැති අතර කම්කරුවන්ගේ ආන්ඩුවක් පිලිබඳ ප්‍රශ්නය ගැන වචනයක්වත් නැත.

දෙසතියකට පසුව මැයි 27 දා වර්ජිත කම්කරුවෝ ආන්ඩුව, හාම්පුතුන්ගේ සංගම් සහ වෘත්තීය සමිති විසින් ගිවිසගත් ග්‍රෙනල් ගිවිසුම ප්‍රතික්ෂේප කලහ. බලය පිලිබඳ ප්‍රශ්නය විවෘතව ම ඉදිරියට පැමිනුනි.

ඩි මැසෝ මේ පිලිබඳව දැනුවත් ය. "මිලියන ගනන් වර්ජිතයෝ රාජ්‍ය යන්ත්‍රය එක්වර ම සොලවා තිබුනි. ආන්ඩුව, ව්‍යාපාරිකය සහ කම්කරු ව්‍යාපාරයේ නායකයන් එකඟවුනු ප්‍රවේසමෙන් ඔප මට්ටම් කරන ලද සැලසුම් පසෙකට විසි කරනු ලැබිනි...දැන් බලය පිලිබඳ ප්‍රශ්නය ඍජුව ම ඉස්මතු වේ... මහා වැඩ වර්ජනයේ ඉල්ලීම් ඉටුකර ගැනීමට ආන්ඩුව පසෙකට අතු ගා දැමිය යුතු ය," යි ඔහු ලියයි. [17]

ඒ අතර ඕසීඅයි ගමන් කලේ සිද්ධීන්ට පසු පසිනි. කම්කරු සන්ධානයේ කමිටුවල අනුග්‍රහය යටතේ එය පලකල, විශාල ගනනින් බෙදා හරින ලද පත්‍රිකාවක ආන්ඩුව පිලිබඳ ප්‍රශ්නය ගැන වචනයක්වත් කියනු ලැබුවේ නැත.

"අත්සන් නො කරනු!" යයි පිටු භාගයක් පුරා කැපිටල් තද කලු අකුරින් පස්වතාවක් එය පුනරුච්චාරනය කලේ ය. කොයි හැටියෙන් ගත්තත් මේ වනවිට ග්‍රෙනල් ගිවිසුම අත්සන් තැබීම ගැන ඕනෑම කතාවක් නිෂ්ඵල ය. සීජීටී නායක ජෝර්ජස් සේගයිව රෙනෝල්ට් කම්කරුවන් විසින් දැක්වූ සතුරු ප්‍රතිචාරයෙන් පසුව වෘත්තීය සමිතිය වෙවුලුම් කා තාවකාලිකව පසුපසට අඩිය තැබී ය.

"සීජීටී, සීජීටී, එෆ්ඕන් (ප්‍රධාන කම්කරු සම්මේලන) නායකයිනිඃ ඔබලා යූඑන්ඊඑෆ් සමගින් ආන්ඩුවට සහ රාජ්‍යයට එරෙහිව එක්සත් පන්ති පෙරමුනක් ස්ථාපනය කල යුතු ය," යන ඉල්ලීම සමගින් ඕසීඅයි පත්‍රිකාව කුටක ප්‍රාප්ත විය.

එදින ම පියරේ මෙන්ඩෙස්-ෆ්‍රාන්ස් යටතේ අන්තර්වාර ධනේශ්වර ආන්ඩුවකට මාර්ගය මෘදු කිරීම සඳහා පීඑස්යූ (එක්සත් සමාජවාදී පක්ෂය), යූඑන්ඊඑෆ් සහ සීඑෆ්ඩීටී වෘත්තීය සමිතියේ ඒකාබද්ධ රැස්වීමක් පැරිස්හි චාලේටි ක්‍රීඩාංගනයේ පැවැත්විනි. අපර දෘෂ්ටියකින් ඩි මැසෝ මෙම රැස්වීම "දෙපිට කැපෙන දේශපාලනික මෙහෙයුම්" සූදානම් කල "දෙබිඩිකම්වල සැනකෙලියක්" ලෙස විස්තර කරයි.

"ප්‍රථම ඉලක්කය වන්නේ විශේෂයෙන් ම ස්ටැලින්වාදීන්ගේ පාලනයෙන් ගිලිහී තිබුනු තරුනයන් ද ඇතුලු මහා වැඩ වර්ජනයේ සටන්කාමී කොටස හික්මවා ගැනීම යි... තව ද පලමු ඉලක්කය සමග ඍජු සම්බන්ධතාවෙන් යුතුව කැබිනට් අර්බුදයට ධනේශ්වර විසඳුමක් සඳහා වටපිටාව සකස් කිරීම යි. මෙන්ඩේස්-ෆ්‍රාන්ස් හෝරාවේ මිනිසා ලෙස ඉදිරිපත් කරනු ලැබිනි...," යයි ඔහු දිගට ම ලියාගෙන යයි. [18]

එහෙත් මෙහි දී ද ඕසීඅයිට තම දෘෂ්ටිය පැහැදිලි කිරීමට අනේක කාලයක් තිබුන ද එය කලේ පවත්නා තත්ත්වයට අනුගත වීම යි. පියරේ ලොම්බෙයා චාලෙටිහි කථිකයෙක් ලෙස පෙනී සිටියේ ය. ඔහු මෙහි දී එහි පැමින සිටි 50,000ක් පමන කම්කරුවන් සහ තරුනයන් ආමන්ත්‍රනය කලේ ඕසීඅයි නායකයා ලෙස නොව ඒ වෙනුවට ඔහු වැඩකල "කම්කරු බලය සමාජ රක්ෂනයේ සේවක සහ කේඩර වෘත්තීය සමිති මන්ඩලයේ" නමින් පෙනී සිටි වෘත්තීය සමිතිවාදියෙක් ලෙස ය.

"තීරනාත්මක සටන එලැඹෙමින් තිබෙනවා. මහා වැඩවර්ජනය ආන්ඩුව පිලිබඳ ප්‍රශ්නය ඉදිරියට ගෙනැවිත් තිබෙනවා. ඩි ගෝල් සහ පොම්පිඩෝගේ ආන්ඩුවට වර්ජකයන්ගේ ඉල්ලීම් ඉටු කල නො හැකියි," ඔහු එහි දී මෙසේ ප්‍රකාශ කලේ ය. ඩි මැසෝගේ වාර්තාවට අනුව පෙනී යන්නේ ඔහු අන්තර්වාර ධනේශ්වර ආන්ඩුවක අන්තරායන් පිලිබඳව අනතුරු ඇඟවීමට හෝ කම්කරුවන්ගේ ආන්ඩුවක් පිලිබඳ ප්‍රශ්නය ආමන්ත්‍රනය කිරීමට අසමත් වූ බව ය. ඒ වෙනුවට ලොම්බෙයා කලේ ඔහු ජයග්‍රහනයට මාවත ලෙස දැක්වූ ප්‍රාදේශීය ස්ට්‍රයික් කමිටු මෙන් ම මධ්‍යම ස්ට්‍රයික් කමිටුවක් ගොඩනැගීම සඳහා ආයාචනා කිරීමට තමන් ම සීමා වී ගැනීම යි. [19]

ඒ අතරවාරයේ වීදිවල "ජනතාවගේ ආන්ඩුවක්" සඳහා වන ඉල්ලීම් දෝංකාර දුනි. කම්කරුවන්ගේ ඉල්ලීම් පැහැදිලිව ම ලොම්බෙයාගේ ඉල්ලීම්වලට වඩා ඉදිරිගාමී විය.

ඩි මැසෝ මෙසේ ලියයිඃ "ආන්ඩුව හා රාජ්‍යය පිලිබඳය සඳහන් කරමින් 'අත්සන් නො කරනු!' යන්නේ ඇඟවීම් දේශපාලනික භාෂාවට පෙරලුනු විරෝධතා ප්‍රන්සය පුරා මැයි 27 දා පැවතුනි...'ජනතාවගේ

ආන්ඩුවක්!' යනුවෙන් විරෝධතාකරුවෝ මතුරන්නේ ඔවුන්ට අවශ්‍ය මහා වැඩවර්ජනයේ ඉලක්කයන්වලට ප්‍රතිචාර දක්වන අන්ඩුවක් යන්න ප්‍රකාශනය කරමිනි. 'ඩි ගෝල් ඉල්ලා අස්වනු,' 'ඩි ගෝල් හෙලනු' යනුවෙන් කෑ ගසන දස දහස් ගනන් මිනිස්සු පරදුවට තැබී ඇත්තේ තන්ත්‍රයේ ඉරනම යයි පැහැදිලිව පෙන්නුම් කරමින් සිටිති." [20]

"ජනතා ආන්ඩුවක්" සඳහා වන මෙම ඉල්ලීම දේශපාලනික අන්තර්ගතයකින් පිරවීමට ඕසීඅයි ප්‍රයත්නයක් දැරුවේ නැත. *සියල්ලටමත් වඩා එවැනි ආන්ඩුවක් තැනිය යුත්තේ කවුරුන් ද, එහි දේශපාලනික වැඩපිලිවෙල කුමක් විය යුතු ද යන්න එය විග්‍රහ කලේ නැත. මෙම තතු කිසි දිනෙක බලය ගැනීම පිලිබඳව උපකල්පනයක්වත් නො කල එමෙන් ම අන්තර්වාර ධනේශ්වර ආන්ඩුවකට සහභාගි වීම ගැන තිරයෙන් පිටුපස මිතරොං සමග සාකච්ඡා කරමින් සිටි ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂයේ (ප්‍රකොප) සහ සීජීටීයේ ස්ටැලින්වාදීන්ට ද "ජනතා ආන්ඩුවක්" යන සටන් පාඨය ඉස්මතු කිරීමට හැකි කලේ ය.*

මෙම ලිපිමාලාවේ 4වන කොටසේ විස්තර කරන ලද පරිදි මේ මොහොත වනවිට ප්‍රකොපයේ සහ සීජීටීයේ ආන්ඩුවක් පිලිබඳ ඉල්ලීම විශාල දේශපාලනික බලපෑමක් ඇති කල හැකිව තිබිනි. එය *ස්ටැලින්වාදී නායකයන්ගේ උපාමාරු අඩපන කොට ඔවුන් සහ කම්කරු පන්තිය අතර ගැටුම තීව්‍ර කල හැකිව තිබිනි.*

ට්‍රොට්ස්කි එවැනි උපායක් "සංක්‍රමන ක්‍රියාමාර්ගය" තුල යෝජනා කොට තිබිනි. *රුසියන් විප්ලවය තුල බොල්ශෙවිකයන්ගේ අත්දැකීම් මත තමන් ම පදනම් වෙමින් ඔහු මෙසේ ලිවීය:*

*"මෙන්ෂෙවිකයන්ට සහ එස්ආර්වරුන්ට ආයාචනා කල බොල්ශෙවික්වරුන්ගේ ඉල්ලීම වූ 'ධනේශ්වරයෙන් කැඩෙනු, බලය නුඹලා අතට ගනු!' යන්න මහජනතාව සඳහා දැවැන්ත අධ්‍යාපනික වටිනාකමක් දැරී ය.* ජූලි දිනවල දී එතරම් නාටකාකාර ලෙස හෙලිදරව් වූ බලය ගැනීමට මෙන්ෂෙවිකයන්ගේ සහ එස්ආර්වරුන්ගේ මුරන්ඩු නො කැමැත්ත මහජන මතය ඉදිරියේ ඔවුන් හුදකලා කොට බොල්ශෙවිකයන්ගේ ජයග්‍රහනය සූදානම් කලේ ය." [21]

ඕසීඅයි සංවිධානය එවැනි ඉල්ලීමක් කිසි දිනෙක ඉදිරිපත් නො කල අතර ඒ වෙනුවට ස්ටැලින්වාදීන්ගේ ද්විත්ව රංගනය විවේචනය නො කොට "ජනතා ආන්ඩුවක් සඳහා" යන සටන්පාඨය යටතේ මැයි 29 දා පැවති සීජීටීයේ මහා උද්ඝෝෂනයට සහයෝගය දැක්වී ය.

ඩැනියල් කෝන්-බෙන්ඩිට් ප්‍රන්සයෙන් නෙරපා හැරීම හෙලාදැකීම සීජීටීය විසින් ප්‍රතික්ෂේප කිරීමේ පදනම මත යූඑන්ඊඑෆ් සහ සීඑෆ්ඩීටී විරෝධතාවට සහභාගි නො වීම පිලිබඳව ඕසීඅයි එම සංවිධානවලට පහර ගැසී ය. *සංක්ෂිප්තව ගතහොත් ඕසීඅයි කියා සිටියේ සියලු වෘත්තීය සමිතිවල ඒකාබද්ධ විරෝධතාවක් සීජීටීයේ අරමුනු නො තකා කම්කරුවන්ගේ ආන්ඩුවක් සඳහා ස්වයංක්‍රීයව මගපාදනු ඇති බවයි. "ඒකරූපීව සියලු වෘත්තීය සමිති සංවිධාන විසින් සංවිධානය කරන ලද මෙය මහා වැඩ වර්ජනය සහ කම්කරුවන්ගේ සංවිධාන මත රඳ සිටින ආන්ඩුවක් සඳහා මග විවර කරනු ඇත" යි ඩි මැසෝ ලියයි. 22*

මැයි 29 දා විරෝධතාවේ දී කම්කරු සන්ධාන කමිටුව විසින් නිකුත් කරන ලද පත්‍රිකාව, ඕසීඅයි විසින් කැඳවුම් කරන ලද "මධ්‍යම සහ ජාතික ස්ට්‍රයික් කමිටුව" කම්කරුවන්ගේ ආන්ඩුවකට සමාන කලේ ය: " *"කම්කරුවන්, ශිෂ්‍යයන්, ගොවීන් සහ තරුනයන්ගේ සියලු ඉල්ලීම් ඉෂ්ට කලහැකි එකම කම්කරුවන්ගේ ආන්ඩුව එයයි," යයි පත්‍රිකාව කියා සිටියේ ය.* [23]

මෙහි අර්ථය වන්නේ ස්ට්‍රයික් කමිටුව කම්කරුවන්ගේ ආන්ඩුවකට පදනම් විය හැකි කම්කරු හෝ සෝවියට් සභාවක් ලෙස ඕසීඅයි සැලකූ බව ද? පත්‍රිකාව තුල එන සූත්‍රගත කිරීම් මෙය යෝජනා කරයි. *එහෙත් මෙය වනාහි හුදකලා උදාහරනයක් පමනි. මෙම ප්‍රශ්නයේ දී ඕසීඅයි පැහැදිලිව ම අවිනිශ්චිතව සිටියේ ය.*

අනෙක් අතට ස්ට්‍රයික් කමිටු සහ කම්කරු සභා විප්ලවවාදී නායකත්වය පිලිබඳ ගැටලුව විසඳන්නේ නැත. *ඒවා වනාහි ස්ටැලින්වාදයට එරෙහි දේශපාලනික අරගලය සිදුවිය හැකි සටන් බිමක් මිස එම අරගලයට ආදේශකයක් නො වේ. එහෙත් ඕසීඅයි පත්‍රිකාවේ ප්‍රකොපය සහ සීජීටී කෙරෙහි විවේචනාත්මක එකදු වචනයක්වත් අඩංගු නො වීය. ඒවා පිලිබඳව සඳහනක්වත් නො වීය.*

පැරිසිය තුල පමනක් මිලියන බාගයක් ජනයා වීදි බට සීජීටී විරෝධතාවට පසු දින ගුවන් විදුලියෙන් ජාතිය ඇමතූ ජනාධිපති ඩි ගෝල් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නිවේදනය කලේ ය. *නව මැතිවරන පිලිබඳ නිවේදනය සාදරයෙන් පිලිගත් ප්‍රකොපය සහ සීජීටීය මහා වැඩ වර්ජනය අත්හැර දැමීමට සමාන වූ තම කීකරු කල්ක්‍රියාව පවත්වාගෙන යාමට ප්‍රතිඥා දුන්හ.*

ඕසීඅයි ප්‍රතිචාර දැක්වූයේ වැඩ වර්ජනය නො නවත්වා කරගෙන යාමට වූ ආයාචනයක් සහ වෘත්තීය සමිතිවලට කල ආයාචනා සමගිනි: *"සියල්ල රැඳී පවත්නේ අපගේ ක්ෂනික පිලිතුර මත යි! සියල්ල රඳ පවත්නේ වෘත්තීය සමිති මූලස්ථාන සහ කම්කරුවන්ගේ*

*පක්ෂවල ඉල්ලීම් උඩ යි! මහා වැඩ වර්ජනය පොලිස් රාජ්‍යය පරාජය කරනු ඇත."* [24]

පසුව පැමිනි දිනවල ඕසීඅයිහි දේශපාලනික ආස්ථානය වූයේ මෙය යි. *එක්සත් භාවය, අරගලය දිගට ම පවත්වාගෙන යාම සහ පසු නො බැසීම පිලිබඳ ආයාචනා සියල්ල කරන ලද්දේ මහා වැඩ වර්ජනයේ ගෙල සිරකරමින් සිටි වෘත්තීය සමිති සහ පක්ෂවලට ම ය.*

ජුනි 12 දා අභ්‍යන්තර කටයුතු ඇමතිවරයා ඕසීඅයිහි ශිෂ්‍ය සහ තරුන සංවිධාන ද ඇතුලත් තවත් සංවිධාන දුසිමක් සමග ඕසීඅයි තහනම් කලේ ය.

*මතු සම්බන්ධයි.*

**සටහන්:**

14. *මෙය සහ පසුව ට්‍රොට්ස්කිගෙන් කරන උපුටා දැක්වීම් සඳහන් කර නොමැතිවිට උපුටා දක්වන්නේ [Leon Trotsky. Comittees of Action-Not People's Front. (ලියොන් ට්‍රොට්ස්කි "ක්‍රියාකාරී කමිටු- මහජන පෙරමුන නො වේ" (1935 නොවැම්බර් 26)]*

15. *Francois de Massot. "La greve generale (Mai-Juin 1968), ප්‍රන්ශුවා ඩි මැසෝ, "ලා ග්‍රේව් ජෙනරලේ (මැයි-ජුනි 1968)",පි. 123*

16. *ප්‍රන්ශුවා ඩි මැසෝ, "ලා ග්‍රේව් ජෙනරලේ (මැයි-ජුනි 1968)",පි. 48*

17. *ප්‍රන්ශුවා ඩි මැසෝ, "ලා ග්‍රේව් ජෙනරලේ (මැයි-ජුනි 1968)",පි. 188*

18. *ප්‍රන්ශුවා ඩි මැසෝ, "ලා ග්‍රේව් ජෙනරලේ (මැයි-ජුනි 1968)",පි. 195*

19. *ප්‍රන්ශුවා ඩි මැසෝ, "ලා ග්‍රේව් ජෙනරලේ (මැයි-ජුනි 1968)",පි. 196-197*

20. *ප්‍රන්ශුවා ඩි මැසෝ, "ලා ග්‍රේව් ජෙනරලේ (මැයි-ජුනි 1968)",පි. 197*

21. *[Leon Trotsky,The Transitioíl Programme, ලියොන් ට්‍රොට්ස්කි, "සංක්‍රමන ක්‍රියාමාර්ගය"]*

22. *ප්‍රන්ශුවා ඩි මැසෝ, "ලා ග්‍රේව් ජෙනරලේ (මැයි-ජුනි 1968)",පි. 203*

23. *ප්‍රන්ශුවා ඩි මැසෝ, "ලා ග්‍රේව් ජෙනරලේ (මැයි-ජුනි 1968)",පි. 304*

24. *ප්‍රන්ශුවා ඩි මැසෝ, "ලා ග්‍රේව් ජෙනරලේ (මැයි-ජුනි 1968)",පි. 248*

© www.wsws.org